මගේ අංකය - SG/Admin/cs/03

ආයතන අංශය

2021.06.15

සියළුම අතිරේක සර්වේයර් ජනරාල් වරුන්,

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් වරුන්,

අධ්‍යක්ෂ(මුදල්)/අධ්‍යක්ෂ(මැ.සි.ආ)

පළාත් සර්වේයර් ජනරාල් වරුන්,

නියෝජ්‍ය සර්වේයර් ජනරාල් වරුන්,

ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීවරුන්/මිනින්දෝරු අධිකාරී වරුන්,

සියළුම මිනින්දෝරු වරුන් හා ආධුනික මිනින්දෝරු වරුන්,

ඇතුළු සියළුම නිලධාරීන්

**<u>Covid 19 වසංගතය තුළ මාසික වැඩ ඉලක්ක ලබා දීම සම්බන්ධවයි.</u>**

යොමුගත කරුණට අදාළව මටද පිටපතක් සහිතව ලේකම්,රජයේ මිනින්දෝරු සංගමය ඇමතූ ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ අංක 2/3/03/06 හා 2021.06.15 දිනැති ලිපියේ ඇතුළත් කරුණු පිළිබඳව ඔබගේ අවධානය යොමු කරවමි.(අදාළ ලිපියේ පිටපතක් අමුණා ඇත)ඒ අනුව රජයේ ප්‍රමුඛ සංවර්ධන කාර්යයන් අඛණ්ඩව හා බාධාවකින් තොරව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

ඩබ්.ටී.එම්.එස්.බී.තෙන්නකෝන්
සර්වේයර් ජනරාල්

ඩබ්ලිව්.ටී.එම්.එස්.බී. තෙන්නකෝන්
සර්වේයර් ජනරාල්
සර්වේයර් ජනරාල් කාර්යාලය
කොළඹ 05.

# ඉඩම් අමාත්‍යාංශය
# காணி அமைச்சு
# Ministry of Lands

"මිහිකත මැදුර",
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පටුමඟ,
බත්තරමුල්ල.

"மிஹிகத்தமெதுர",
காணிச் செயலகம்
1200/6, இராஜமல்வத்தைவீதி,
பத்தரமுல்லை.

"MihikathaMedura",
Land Secretariat,
1200/6, RajamalwatteAvenue,
Battaramulla.


| | | |
|---|---|---|
| මගේ අංකය / எனதுஇல. / My No. : 2/3/03/06 | ඔබේ අංකය / உமதுஇல. / Your No. : | දිනය / திகதி / Date : 2021.06. 15. |

ලේකම්

රජයේ මිනින්දෝරු සංගමය

<u>Covid 19 වසංගතය තුළ මාසික වැඩ ඉලක්ක ලබා දීම සම්බන්ධවයි.</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබ සංගමය විසින් ගරු ඉඩම් අමාත්‍යතුමා, මැනුම්පති සහ මා අමතා එවන ලද ඔබේ අංක 2021/13-10 හා 2021.06.13 දිනැති ලිපිය හා බැඳේ.

02. ඔබගේ අංක 2021/13-10 හා 2021.03.03 දිනැති ලිපිය මඟින් මැනුම්පති විසින් නිකුත් කරන ලද මාසික වැඩ ප්‍රමාණ සංශෝධිත චක්‍රලේඛය අවලංගු කරන ලෙස ඉල්ලා තිබු අතර ඒ සම්බන්ධයෙන් මගේ අංක 2/3/03/06 හා 2021.03.17 දිනැති ලිපියෙන් එම චක්‍රලේඛය තාවකාලිකව අත්හිටුවන ලදී.

03. ඔබ සංගමයේ ප්‍රධානතම ඉල්ලීම වූ එම චක්‍රලේඛය අත්හිටුවීම සිදු කිරීමෙන් පසුවද දිගින් දිගටම තව තවත් ඉල්ලීම් ඉදිරිපත් කරමින් වෘත්තීය ක්‍රියාමාර්ග යැයි පවසමින් තම රාජකාරිය පැහැර හැරීමට කටයුතු කරනු ලැබිය. එසේ කටයුතු කරමින් තිබියදීත් ඔබ සංගමය ඉදිරිපත් කර තිබූ ඉල්ලීම් අනුව 2021.03.29, 2021.03.31 හා 2021.04.19 යන දිනවල ගරු ඉඩම් අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා පවත්වන ලදී. ඒ අනුව මගේ අංක 2/3/03/06 හා 2021.04.05 දිනැති ලිපියෙන් හා 2021.04.27 දිනැති ලිපියෙන් එම ඉල්ලීම් සඳහා ගනු ලබන විසඳුම් පිළිබඳව දැනුම් දෙන ලදී.

04. ඔබ සංගමය විසින් එම වෘත්තීය ක්‍රියාමාර්ගය තවදුරටත් පවත්වාගෙන යාම හේතුවෙන් නැවතත් 2021.05.01 දින අවසන් වශයෙන් ගරු අමාත්‍යතුමා සමඟ සාකච්ඡාවක් පවත්වා ලබා දිය හැකි විසඳුම් පිළිබඳව ඔබ දැනුවත් කරන ලදී. එහිදී සාකච්ඡා කරන ලද ඔබ සංගමයේ ඉල්ලීම් අතරින්,

i. පුද්ගලික මැනුම්වල යෙදීම සඳහා ලබා දෙන වාර්ෂික මැනුම් බලපත්‍ර සම්බන්ධයෙන් කටයුතු ඉටු කර ඇත.
ii. රජයේ මිනින්දෝරුවන්ගේ ලියාපදිංචිය ලබා දීම සම්බන්ධයෙන් කටයුතු සිදු කර ඇත.
iii. මාසික ලැගුම් දීමනාව වැඩිකිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
iv. මිනින්දෝරු අධිකාරීවරුන්ගේ ප්‍රවාහන පහසුකම් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි සැතපුම් කුලී දීමනාව ලබා දීමට කටයුතු කර ඇත.
v. SRIMS දත්ත පද්ධතිය පිළිබඳව ඉදිරිපත් කරන ලද ගැටලු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුගත මට්ටමින් පරීක්ෂාවක් සිදු කර ඇති අතර, එහිදී විධිමත් පරිදි එම කටයුතු සිදු වන බව මැනුම්පති විසින් තහවුරු කර ගෙන ඇත.
vi. ලැප්ටොප් දීමනා ලබා දීම සඳහා වන ඉල්ලීම ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත.
vii. ආධුනික මිනින්දෝරුවන් සඳහා දුරකථන දීමනාවක් ලබා දීමට ද අවශ්‍ය කටයුතු සිදු කර ඇත.
viii. වාරි සෞභාග්‍යා වැඩසටහන සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දී ඇති උපදෙස් අනුව ඉදිරි කටයුතු කෙරෙමින් පවතී.

05. 2021.05.01 දින ගරු අමත්‍යතුමා සමඟ පැවති සාකච්ඡාවෙන් පසු උක්ත සඳහන් කර ඇති කරුණු 08 සඳහා අවශ්‍ය විසඳුම් කඩිනමින් ලබා දීමට යටත්ව 2021.05.03 දින සිට වෘත්තීය ක්‍රියාමාර්ග අත්හිටුවා රාජකාරිවල යෙදීමට කටයුතු සිදු කරන බව ඔබ සංගමය විසින් දන්වා සිටිමුත් මෙතෙක් විධිමත් පරිදි රාජකාරියට වාර්තාකොට ඔබ වෙත ලබා දී ඇති කාර්යයන් ඉටු කර නොමැති බව නිරීක්ෂණය කරමි.

06. එමෙන්ම, ඔබ විසින් 2021.06.13 දිනැතිව ගරු අමාත්‍යතුමා, මැනුම්පති හා මා අමතා යොමු කළ ලිපිය සළකා බැලීමේදී එම ලිපියේ අඩංගු කරුණු අනුව,

- වෘත්තීය සමිති මට්ටම ඉක්මවා යමින් ආයතනයේ කළමනාකාරිත්වයට බලපෑම් සිදු කිරීමට උත්සාහ දරා ඇති බව
- රාජ්‍ය සේවා චක්‍රලේඛ අනුව හා සෞභාග්‍යයේ දැක්ම යටතේ ඉටු කළ යුතු මැනුම් කටයුතු ඉටු කිරීම පැහැර හරින ලෙස සංගමයේ නිලධාරීන් වෙත බලපෑම් කර ඇති බව
- දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීමේ බලතල සතු අමාත්‍ය මණ්ඩල ක්‍රියාපටිපාටිය අභියෝගයට ලක් කිරීම යන වෘත්තිය සංගමයකට අනුචිත ආකාරයට කටයුතු කරන බව නිරීක්ෂණය කරමි.

07. ඔබ විසින් මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග අනුව පෙනීයන්නේ රජයේ සංවර්ධන ක්‍රියාදාමයන් සඳහා වන දායකත්වය හිතාමතා පැහැර හැරීමක් සිදු කරන බවයි. ඒ සඳහා ඔබ සංගමය විසින් රජයේ මිනින්දෝරුවරුන් වෙත පැවරී ඇති රාජකාරී නිසි පරිදි ඉටු කිරීම වලක්වාලමින් වෘත්තිය සමිතියකට ගත හැකි ක්‍රියාමාර්ග අභිභවායමින් සිදු කරන කාර්යයන් වහාම නවතා දමන ලෙස මෙයින් දැනුම් දෙමි. එබැවින් පරිපාලනයට අවනතව තම රාජකාරී අනලස්ව ඉටුකල යුතු බව අවධාරණය කරමි.

08. තවදුරටත් මෙම කරුණු නොසලකා හරිමින් එසේ රාජකාරී පැහැර හැරීමක් සිදු කරනු ලැබුවහොත් එවැනි නිලධාරින්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට සිදු වන බව වැඩිදුරටත් දැනුම් දෙන අතර එම සාමාජිකයන් වෙත පුද්ගලික මැනුම්වල යෙදීමට ලබා දී ඇති වාර්ෂික බලපත්‍රය අත්හිටුවීමට කටයුතු කරන ලෙස ගරු අමාත්‍යතුමා විසින් මා වෙත දැනුම් දී ඇත.

මේ සම්බන්ධයෙන් ඔබ සංගමය යහපත් ප්‍රතිචාර දක්වනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

ආර්.ජේ.ජේ.කේ. රණවක

ලේකම්

ඉඩම් අමාත්‍යාංශය

පිටපත :- මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව - සියලුම නිලධාරීන් දැනුවත් කිරීම සඳහා